# 1 පරිමිතිය

**මෙම පාඩම ඉගෙනීමෙන් ඔබට**

- කේන්ද්‍රික ඛණ්ඩයක පරිමිතිය සෙවීමට,
- කේන්ද්‍රික ඛණ්ඩ ආශ්‍රිත තල රූපවල පරිමිතිය සෙවීම සම්බන්ධ ගැටලු විසඳීමට

හැකියාව ලැබෙනු ඇත.

## තල රූපවල පරිමිතිය

සෘජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රිකෝණය සහ වෘත්තය යන තල රූපවල පරිමිතිය සෙවීම පිළිබඳ ව මීට පෙර ශ්‍රේණිවල දී ඔබ හදාරා ඇත. ඒ පිළිබඳ ව කරුණු සාරාංශ කර මෙසේ දැක්විය හැකි ය.

| තල රූපය | | පරිමිතිය |
|---|---|---|
| සෘජුකෝණාස්‍රය |  | $2$ (දිග $+$ පළල) |
| සමචතුරස්‍රය |  | $4 \times$ පැත්තක දිග |
| ත්‍රිකෝණය |  | පාද තුනේ දිගෙහි එකතුව |
| වෘත්තය |  | $2\pi \times$ අරය |

**පුනරීක්ෂණ අභ්‍යාසය**

**1.** පහත දැක්වෙන එක් එක් තල රූපයේ පරිමිතිය සොයන්න.




**2.** පහත දැක්වෙන රූපයේ පරිමිතිය සොයන්න.




මූලික තල රූපවල පරිමිතිය මෙන්ම සංයුක්ත තල රූපවල පරිමිතිය සෙවීම පිළිබඳ කරුණු ඉහත පුනරීක්ෂණ අභ්‍යාසය මගින් ඔබේ මතකයට නැගෙන්නට ඇත. දැන්, කේන්ද්‍රික ඛණ්ඩවල පරිමිතිය පිළිබඳ ව විමසා බලමු.

## 1.0 කේන්ද්‍රික ඛණ්ඩය




මෙම රූපයේ අඳුරු කොට ඇත්තේ කේන්ද්‍රය $C$ වූ වෘත්තයක අර දෙකකින් හා පරිධියේ කොටසකින් මායිම් වූ පෙදෙසකි. එවැනි පෙදෙසකට **කේන්ද්‍රික ඛණ්ඩයක්** යැයි කියනු ලැබේ. අර දෙක අතර කෝණය වන $\theta\ (A\hat{C}B)$ට **කේන්ද්‍ර කෝණය** යැයි කියනු ලැබේ.

මෙම කේන්ද්‍ර කෝණය $0^\circ$ සිට $360^\circ$ තෙක් වූ ඕනෑම අගයක් විය හැකි ය.